2024.12.20 අද පිටුව 3

# ශ්‍රී ලංකාවේ 15 වැනි ජන හා නිවාස සංගණනය අවසන්

## - මූලික වාර්තාව මසක් ඇතුළත ලබාදීමට සූදානම්

● තමිල පෙරේරා

ශ්‍රී ලංකාවේ 15 වැනි ජන හා නිවාස සංගණනය සාර්ථකව අවසන් කළ බව ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව පවසයි.

එහි අධ්‍යක්ෂ ජනරාල් අනෝජා සෙනෙවිරත්න මහත්මිය සඳහන් කළේ මසක් ඇතුළත සංගණනය පිළිබඳ මූලික වාර්තාව විෂය භාර අමාත්‍යවරයා ලෙස ජනාධිපතිවරයා වෙත ලබාදීමට අපේක්ෂා කරන බවයි. මාස හයක පමණ කාලයක් තුළ සවිස්තරාත්මක වාර්තාව ඉදිරිපත් කිරීමට හැකි වනු ඇති බවද සෙනෙවිරත්න මහත්මිය වැඩිදුරටත් සඳහන් කළාය.

ශ්‍රී ලංකාවේ ජන හා නිවාස සංගණනය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් වසර දහයකට වරක් පවත්වනු ලබන අතර, මෙම සංගණනයේ පළමු වැනි අදියර ලෙස මුළු දිවයිනම ග්‍රාම නිලධාරී කොට්ඨාසය පදනම් කර ගනිමින් සංගණන කාණ්ඩ ලෙස කුඩා කොටස්වලට වෙන් කර සිතියම්ගත කිරීමත්, එම සිතියම පදනම් කර ගනිමින් දෙවැනි අදියර වන ගොඩනැගිලි හා ඒකක රතු ලේබලයක් අලවා ලැයිස්තුගත කිරීමත් 2023 වසරේ සිදුකරනු ලැබීය.

එම ලැයිස්තුව පදනම් කරගනිමින් රටෙහි ජීවත්වන සියලුම පුද්ගලයින්ගේ හා නිවාසවල තොරතුරු රැස්කිරීම 2024 ඔක්තෝබර් 07 වැනි දින ආරම්භ කරනලද අතර, එය 2024 දෙසැම්බර් 23 වැනි දිනෙන් අවසන් වීමට නියමිතය.

සංගණන ආඥා පනත යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව පවත්වනු ලබන ජන හා නිවාස සංගණනයේදී පුද්ගලයින් නිවැරදි තොරතුරු සැපයීමට බැඳී සිටින අතර, එම තොරතුරු පුද්ගල මට්ටමින් කිසිම පාර්ශ්වයකට හෙළි නොකිරීමට සියලුම සංගණන නිලධාරීන් බැඳී සිටී. එහිදී, පුද්ගලයින්ගේ සාමාන්‍ය පදිංචියට අදාළ ජනගහනයේ ප්‍රමාණය, භූගෝලීය විසිරීම, අධ්‍යාපන මට්ටම්, භාෂා කුසලතා, පරිගණක සාක්ෂරතාවය, කියවීමේ සහ ලිවීමේ හැකියාව, රැකියා විස්තර, ශාරීරික හා මානසික අපහසුතා ආදිය තොරතුරු මෙන්ම, නිවාස පිළිබඳ තොරතුරුද විමසා ලබාගැනීම සිදුකර තිබුණි.

සාමාන්‍ය පදිංචි යටතේ මේ ආකාරයට කටයුතු කර තිබූ අතර, පදිංචි ස්ථානයක් නිශ්චිතව නොමැති යාචකයින් වැනි පුද්ගලයින්ගේ තොරතුරු රැස් කිරීම 2024 දෙසැම්බර් 18 වැනි දින රාත්‍රියේදී සිදුකර තිබුණු අතර, දිස්ත්‍රික් 25ම ආවරණය කරමින් එම කටයුත්තද සාර්ථකව අවසන් කරන ලද බව සඳහන් වේ. මීට අමතරව සාමාන්‍ය පදිංචියක් සහිත පුද්ගලයින්ගෙන් ලබාගත් තොරතුරු "සංගණන දිනය" ලෙස හඳුනාගත් 2024 දෙසැම්බර් 19 වැනි දිනය පදනම් කර ගනිමින් සංශෝධනය කිරීම දෙසැම්බර් 19 සිට දෙසැම්බර් 23දා දක්වා සිදුවන බැවින්, ඒ සඳහාද නොමසුරු සහයෝගය ලබාදෙන ලෙස ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව කාරුණිකව ඉල්ලා සිටියි.

මෙසේ ඉදිරි වසර 10 තුළ රටේ ජාතික ප්‍රතිපත්ති සම්පාදනයට, සැලසුම් සකස් කිරීමට සහ රාජ්‍ය පරිපාලන යාන්ත්‍රණයටද අවශ්‍ය වන දත්ත සම්පාදනය කිරීමේ අරමුණින් පවත්වනු ලැබූ මෙම සංගණනයට නිවැරදි තොරතුරු ලබාදී ඉටුකරනලද වගකීම වෙනුවෙන් ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අනෝජා සෙනෙවිරත්න මහත්මිය සිය ස්තූතිය පුදකර සිටියි.